%

"සම්මානයකට පාර කියන ICT සන්නාමය"

7 ශ්‍රේණිය - පළමු වාර පරීක්ෂණය

(කාලය - පැය 1.30) නම:..

1) මධ්‍ය සැකසුම් ඒකකයේ (CPU) ප්‍රධාන කොටසක් **නොවන්නේ** මින් කුමක්ද?
i. පාලන ඒකකය (Control Unit) ii. අංක ගණිතමය හා තර්කික ඒකකය (ALU)
iii. මතක රෙජිස්තර (Memory Registers) iv. දෘඩ තැටිය (Hard Disk)

2) මධ්‍ය සැකසුම් ඒකකයේ වේගය (Clock Speed) මනිනු ලබන ඒකකය කුමක්ද?
i. GB (ගිගා බයිට්) ii. GHz (ගිගා හර්ට්ස්)
iii. TB (ටෙරා බයිට්) iv. Mbps (මෙගා බිට් තත්පරයට)

3) පරිගණකයක මධ්‍ය සැකසුම් ඒකකය ස්ථාපනය කර ඇත්තේ කුමන උපාංගය මතද?
i. යතුරු පුවරුව (Keyboard) ii. මවුපුවරුව (Motherboard)
iii. දෘඩ තැටිය (Hard Disk) iv. බල සැපයුම් ඒකකය (Power Supply)

4) මධ්‍ය සැකසුම් ඒකකයට සම්බන්ධ කර ඇති දෘඩාංග අතර සන්නිවේදනය හා පාලනය සිදු කරනු ලබන ඒකකය කුමක්ද?
i. අංක ගණිතමය හා තර්කික ඒකකය ii. මතක රෙජිස්තර
iii. පාලන ඒකකය iv. පද්ධති ඒකකය

5) පළමු පරම්පරාවේ පරිගණක සඳහා භාවිතා කරන ලද ඉලෙක්ට්‍රොනික තාක්ෂණය කුමක්ද?
i. ට්‍රාන්සිස්ටර් (Transistors) ii. රික්තක නළ (Vacuum Tubes)
iii. ඒකාබද්ධ පරිපථ (Integrated Circuits) iv. ක්ෂුද්‍ර සකසනය (Microprocessors)

6) වර්තමානයේ අප භාවිතා කරන මේස පරිගණක වල භාවිතා වන තාක්ෂණය වන්නේ?
i. රික්තක නළ ii. ට්‍රාන්සිස්ටර්
iii.ක්ෂුද්‍ර සකසන iv. මහා පරිමාණ ඒකාබද්ධ පරිපථ

7) පරිගණක දෘඩාංග හා මෘදුකාංග පාලනය කරමින් පරිශීලකයාට අතුරු මුහුණතක් සපයනු ලබන්නේ?
i. යෙදුම් මෘදුකාංග ii. මෙහෙයුම් පද්ධතිය
iii. වෙබ් බ්‍රවුසරය iv. ප්‍රති වෛරස් මෘදුකාංග

8) ජංගම දුරකථන වල භාවිතා වන මෙහෙයුම් පද්ධතියකට උදාහරණයක් වන්නේ?
i. MS Windows ii. Linux
iii. Android iv. Ubuntu

9) මෙහෙයුම් පද්ධතියක් මඟින් ඉටු කරනු ලබන කාර්යයක් **නොවන්නේ**?
i. ලිපි ලේඛන සකස් කිරීම ii. දෘඩාංග හා මෘදුකාංග පාලනය
iii. මතකය කළමනාකරණය iv. පරිශීලක අතුරු මුහුණත සැපයීම

10) පරිගණකයක ගොනුවක් (File) හඳුනා ගැනීම සඳහා භාවිතා වන්නේ?
i. ගොනු නාමය පමණි ii. ගොනු දිගුව (File extension) පමණි
iii. ගොනු නාමය හා ගොනු දිගුව යන දෙකම iv. ගොනුවේ ප්‍රමාණය පමණි

11) පරිගණකයේ අභ්‍යන්තර දෘඩ තැටියෙන් මකා දමන ලද ගොනුවක් තාවකාලිකව ගබඩා වන්නේ?
i. My Documents ii. Recycle Bin
iii. Desktop iv. Download Folder

12) IBM 360 සහ CDC 6600 යන පරිගණක අයත් වන්නේ කුමන පරිගණක පරම්පරාවටද?

i. පළමු පරම්පරාව
ii. දෙවන පරම්පරාව
iii. තෙවන පරම්පරාව
iv. සිව්වන පරම්පරාව

13) ගොනුවක හෝ ගොනු බහාලුමක (Folder) නම වෙනස් කිරීමට භාවිතා කරන විධානය කුමක්ද?

i. Delete
ii. Copy
iii. Rename
iv. Properties

14) පහත සඳහන් ඒවායින් චුම්බක මාධ්‍ය ගබඩා උපාංගයක් (Magnetic media device) වන්නේ කුමක්ද?

i. සංයුක්ත තැටිය (CD)
ii. දෘඩ තැටිය (Hard Disk)
iii. පෑන් ධාවක (Pen Drive)
iv. සංඛ්‍යාක බහුවිධ තැටිය (DVD)

15) ෆ්ලොපි තැටියක (Floppy Disk) ධාරිතාව කොපමණද?

i. 1.44 MB
ii. 700 MB
iii. 4.7 GB
iv. 1 TB

16) පරිගණක පරම්පරාවල ක්‍රියාත්මක වීමේ වේගය මනිනු ලබන ඒකක සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් **වඩාත් නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

i. දෙවන පරම්පරාවේ වේගය මනිනු ලැබූ මයික්‍රෝ තත්පර (microseconds) වලට වඩා තෙවන පරම්පරාවේ නැනෝ තත්පර (nanoseconds) වේගවත් වේ.

ii. තෙවන පරම්පරාවේ වේගය මැනීමට පිකෝ තත්පර (picoseconds) භාවිතා කළ අතර, එය සිව්වන පරම්පරාවේ නැනෝ තත්පර වලට වඩා වේගවත් වේ.

iii. පළමු පරම්පරාවේ සිට සිව්වන පරම්පරාව දක්වා පරිගණක වල වේගය මනින ඒකක පිළිවෙලින් මිලි, මයික්‍රෝ, නැනෝ සහ පිකෝ තත්පර ලෙස හැඳින්වේ.

iv. ක්ෂුද්‍ර සකසන (microprocessors) හඳුන්වා දීමත් සමඟ පරිගණක වල වේගය මැනීම සඳහා මයික්‍රෝ තත්පර පමණක් භාවිතා කිරීමට පටන් ගැනුණි.

17) මෙහෙයුම් පද්ධතිය (Operating System) සහ දෘඩාංග අතර සම්බන්ධතාවය පිළිබඳව සලකා බැලීමේදී, පහත සඳහන් කුමන අවස්ථාව මෙහෙයුම් පද්ධතියේ ඍජු කාර්යයක් **නොවන** බව පැවසිය හැකිද?

i. දෘඩ තැටිය (Hard Disk) වැනි ආචයන උපාංග කළමනාකරණය කිරීම.

ii. පරිශීලකයාට දත්ත ඇතුළත් කිරීම සහ තොරතුරු ලබා ගැනීම සඳහා අතුරු මුහුණතක් (Interface) ලබා දීම.

iii. මධ්‍ය සැකසුම් ඒකකය (CPU) තුළ අංක ගණිතමය ගණනය කිරීම් සහ තර්කන කටයුතු (ALU) ඍජුවම සිදු කිරීම.

iv. පරිගණකයට සම්බන්ධ කර ඇති යතුරුපුවරුව සහ මුද්‍රණ යන්ත්‍ර වැනි උපාංග පාලනය කිරීම.

18) පරිගණක ආචයන උපක්‍රම (Storage Devices) ඒවායේ නිෂ්පාදන තාක්ෂණය අනුව වර්ග කිරීමේදී, චුම්භක මාධ්‍ය (Magnetic Media) සහ ප්‍රකාශ මාධ්‍ය (Optical Media) ලෙස **නිවැරදිව** වර්ග කර ඇති යුගලය කුමක්ද?

i. චුම්භක මාධ්‍ය: දෘඩ තැටිය (Hard Disk) / ප්‍රකාශ මාධ්‍ය: සංයුක්ත තැටිය (CD)

ii. චුම්භක මාධ්‍ය: සංයුක්ත තැටිය (CD) / ප්‍රකාශ මාධ්‍ය: ෆ්ලොපි තැටිය (Floppy Disk)

iii. චුම්භක මාධ්‍ය: දෘඩ තැටිය (Hard Disk) / ප්‍රකාශ මාධ්‍ය: පෑන් ඩ්‍රයිව් (Pen Drive)

iv. චුම්භක මාධ්‍ය: පෑන් ඩ්‍රයිව් (Pen Drive) / ප්‍රකාශ මාධ්‍ය: සංඛ්‍යාක බහුවිධ තැටිය (DVD)

19)මෙහෙයුම් පද්ධතිය (Operating System) සහ පරිගණක ගොනු (Files) පිළිබඳව පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.

i. මයික්‍රොසොෆ්ට් වින්ඩෝස් (MS Windows) යනු ජංගම දුරකථන වල පමණක් භාවිතා වන මෙහෙයුම් පද්ධතියකට උදාහරණයකි.

ii. ගොනුවක් අයත් වන යෙදුම් මෘදුකාංගය (Application Software) හඳුනා ගැනීම සඳහා ගොනු දිගුව (File Extension) භාවිතා කළ හැකිය.

iii. මෙහෙයුම් පද්ධතිය මගින් පරිගණකයේ දෘඩාංග සහ මෘදුකාංග පාලනය කරමින් පරිශීලකයාට අතුරු මුහුණතක් සපයනු ලබයි.

iv. ලිනක්ස් (Linux) සහ ඇන්ඩ්‍රොයිඩ් (Android) යනු මෙහෙයුම් පද්ධති සඳහා උදාහරණ වේ

20) පහත දැක්වෙන උපාංග අතරින් ප්‍රතිදාන උපාංගයක් (Output Device) ලෙස හඳුනාගත හැක්කේ කුමක්ද?
i. මූසිකය (Mouse)
ii. යතුරුපුවරුව (Keyboard)
iii. මොනිටරය (Monitor)
iv. ස්කෑනරය (Scanner)

(ලකුණු 2 x 20=40)

පහත ප්‍රකාශ සත්‍ය නම් (✓) ලෙසද, අසත්‍ය නම් (x) ලෙසද සඳහන් කරන්න.

21) මධ්‍ය සැකසුම් ඒකකය (CPU) යනු පද්ධති ඒකකය (System Unit) සඳහා භාවිතා කරන තවත් නමකි.( )
22) ගොනු දිගුව මඟින් එම ගොනුව කුමන යෙදුම් මෘදුකාංගයකට අයත් ද යන්න හඳුනාගත හැකිය.( )
23) පෑන් ධාවක (Pen Drive) යනු චුම්බක මාධ්‍ය ඇසුරින් දත්ත ගබඩා කරන උපාංගයකි.( )
24) මධ්‍ය සැකසුම් ඒකකයක දත්ත තාවකාලිකව රඳවා තබා ගැනීම සිදු කරනු ලබන්නේ මතක රෙජිස්තර මඟිනි.( )
25) පරිගණකයක වේගය කෙරෙහි මධ්‍ය සැකසුම් ඒකකයේ ස්පන්දක වේගය සෘජුවම බලපානු ලබයි.( )
26) ඇන්ඩ්‍රොයිඩ් යනු පරිගණක සහ ජංගම දුරකථන යන දෙකෙහිම බහුලව භාවිතා වන මෙහෙයුම් පද්ධතියකි.( )
27) පද්ධති ඒකකය (System Unit) තුළ ඇති මවුපුවරුවේ මධ්‍ය සැකසුම් ඒකකය ස්ථාපනය කර ඇත.( )
28) ගොනුවක ගුණාංග (Properties) පරීක්ෂා කිරීමෙන් එම ගොනුව නිර්මාණය කළ දිනය සහ එහි ප්‍රමාණය දැනගත හැකිය.( )
29) තෙවන පරම්පරාවේ පරිගණක වල වේගය මැනීම සඳහා මිලි තත්පර (Milliseconds) භාවිතා කරන ලදී.( )
30) පළමු පරම්පරාවේ සිට අද දක්වා පරිගණකයේ වේගය හා විදුලි පරිභෝජනය ක්‍රමයෙන් අඩු වී ඇත.( )

(ලකුණු 1.5 x 10=15)

31) පහත දැක්වෙන පරිගණක උපාංග වගුවේ නිවැරදි තීරුවට ඇතුළත් කරන්න.
උපාංග : යතුරුපුවරුව (Keyboard), මොනිටරය (Monitor), දෘඩ තැටිය (Hard Disk), මූසිකය (Mouse), මුද්‍රණ යන්ත්‍රය (Printer), පෑන් ධාවක (Pen Drive), ස්කෑනරය (Scanner), ශබ්ද විකාශකය (Speakers), සංයුක්ත තැටිය (CD), මයික්‍රොෆෝනය (Microphone), වෙබ් කැමරාව (Web Camera), ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Projector), තීරු කේත කියවනය (Barcode Reader), හිස්බනුව (Headset), මතක කාඩ්පත (Memory Card), සංඛ්‍යාංක බහුවිධ තැටිය (DVD), ජොයිස්ටික් (Joystick), ස්පර්ශ පෑඩය (Touch Pad)

ආදාන උපාංග (Input Devices)	ප්‍රතිදාන උපාංග (Output Devices)	ආචයන උපාංග (Storage Devices)
1.	1.	1.
2.	2.	2.
3.	3.	3.
4.	4.	4.
5.	5.	5.

(ලකුණු 1x 15=15)

32) මධ්‍ය සැකසුම් ඒකකයේ කාර්යයන් 3ක් නම් කරන්න.

*..

*..

*..

(ලකුණු 2x 3=6)

33) උදාහරණ දෙක බැගින් ලියා දක්වමින් පහත වගුව සම්පුර්ණ කරන්න.

ආචයන උපක්‍රම වර්ගය	උදාහරණ

(ලකුණු 1x 9=9)

34) පහත උපාංග හදුනා ගන්න.
(චුම්භක පටි, මවුපුවරුව, සුනම්‍ය තැටිය, මතක කාර්ඩ් පත, මධ්‍ය සැකසුම් ඒකකය, දෘඩ තැටිය, පෑන් ධාවක, ඝන තත්වයේ තැටි ධාවක, සංයුක්ත තැටිය, බාහිර දෘඩ තැටිය)

…………………………..

………………………...

…………………………………….

…………………………………….

…………………………………..

……………………………….

……………………………

……………………………….

…………………………………...

……………………………….

(ලකුණු 1.5x 10=15)